# පොළව යට ප්‍රභාගේ නිදන කාමරය

**කො**ටි ත්‍රස්තවාදී නායක වේළුපිල්ලේ ප්‍රභාකරන් ඇතුළු අනෙක් කොටි රැළ සොයා පන්නා යමින් සිටින ශ්‍රීලංකා රජයේ සන්නද්ධ හමුදා ඒකකයට පෙබරවාරි 2 වෙනි දින මුලතිව් හි පුත්තුකුඩිරිප්පු නම් ප්‍රදේශයේ එක් පාළු ඉඩමක තනා තිබූ බංකරයක් හමුවී ඇත. බංකරය වසා තිබුණේ පොල් අතු පැළැල් ලකිනි. එයතුළට වැදුණු හමුදා භටයන්ට එය පොළව යටට යන්නට තැනූ උමගක් බව පෙනිණ. ඒ උමගට වැදී යටට ගිය විට ඒ තුළ බඩු බාහිරා දිය සමග කාමර හතරක් තිබුණි. ඉන් එකක් ඇඳක් හා පුටු තබා නිදන කාමරය ලෙස සකස්කර තිබූ අතර තවත් පිරික්සීමේදී නිසැක වම එය ප්‍රභාකරන් නිදාගත් කාමරය බවත් ඔහු ඊට කලින් දින කීපයක් දක්වා එහි සිට ඇති බවත් පෙනී ගොස් ඇත. ආරක්ෂක හමුදා එන බව පෙනී ප්‍රභාකරන් පැන යන්නට ඇති බව පරීක්ෂණ හෙළි කළේය.

ඇඳ ළඟම දියවැඩියා රෝග යට එන්නත්කරන බෙහෙත් හා ඉන්ජෙක්ෂන් කටු සහිත භාජන යකි. බිත්තියේ ගසා තිබූ ඔහුගේ ඡායාරූප දෙකක්ද විය. ඉන් එකක් දෙදෙනෙකුගේ පෝටෝ එකකි. එහි සිටින එක් තැනැත්තෙක් ප්‍රභාකරන් වන අතර ඊට වඩා මදක් උසින් යුත් රැවුලක් නැති තැනැත්තා ද හරියටම ප්‍රභාකරන් හා සමානම පුද්ගලයෙකි. කොටිනායකයා



වැනිම තවකෙකු සිටිනවායයි පැතිරී තිබූ ආරංචිය ඇත්තක් බව මේ ඡායාරූපයෙන් දැන් ඔප්පු වන්නේය.

මෙම උමං වාසස්ථානයේ තිබී ප්‍රභාකරන් පාවිච්චි කළ පිස්තෝල හතරක්ද, අළුත්ම වර්ගයේ මැෂින් තුවක්කුවක්ද අළුත්ම වයින් බෝතල කීපයක් හා තවම පැකට්ටුව කඩා නැති Marks & Spencer කමීස කීපයක්ද හමුවී ඇත.


# Mr I. L. Ariyasena

## අයි. එල්. ආරියසේන මහතා

**Beloved husband of Kusum, father of Ranmalee, Nilantha and Janaka, passed away in Sri Lanka on 17. 12. 2008. The funeral took place on 20. 12. 2008 in Colombo.**

**He was a charted Accountant in London and the Hon. Treasure of Matara Rahula College OBA in the UK**

We wish to express our sincere gratitude to Ven. Maha Sanga of Vimala viharaya, Nawala, Lenama Temple (Akuressa), Yatagala Raja Maha Viharaya, Ven. Seelawimala and Ven. Bandula (London Vihara), relatives, friends, Brothers in law - Dr Ivan Amarasinghe and Dr. Diwin Amarasinghe in London, KPMG Ford Rhodes Partners & Staff, Sri Lanka, Rahula OBA UK and Sri Lanka, Association of Professional Sri Lankans (APSL) (UK), McLaren Soares & Co (UK) Goodhope Property Management, Chartered Accountants Institute, Sri Lanka. Special thanks to nephews; Sarath, Sagara, Jagath, Ajith, Dinusha and the Angels who took him to Kalubowila Hospital including Samath Gammampila and Madhu Paskaran.



## May he attain Supreme Bliss of Nirvana

***Loving wife Kusum and children - Ranmalee, Nilantha and Janaka.***

58/19 School Lane, Nawala
37 Sagara Road, Bambaplapitiya
25 Oxleay Road, Harrow, UK
**Tel: 0208 248 3141**
Email: thusha10@hotmail.co.uk

**Almsgiving at London Buddhist Viharaya on Saturday 22 March 2009**

# කොටින්ගේ සබ්මැරීනයත් අල්ලාගත් ආයුධ තොගත් ප්‍රදර්ශනයට කොළඹ ගෙනේ

**උ**තුරේ කොටි ත්‍රස්තවාදීන්ට එරෙහිව ශ්‍රීලංකා සන්නද්ධ හමුදා කළ ආරක්ෂක මෙහෙයුම් වලදී හමුදාවන් විසින් අල්ලාගන්නා ලද කොටින්ගේ රොකට් වෙඩි, මිලිමීටර් 150 කාලතුවක්කු ඇතුළු ආයුධ විශාල ප්‍රමාණයක්ද, මැතදී සොයාගත් කොටි සබ්මැරීනයන්ද, මුහුදු කොටි බෝට්ටු හා වෙනත් යාත්‍රාද පෙබරවාරි 3 වෙනි දින රජය විසින් කොළඹට ගෙනෙ ලදී. පෙබර වාරි 4 වෙනි දින සැමරූ 61 වෙනි නිදහස් දිනයේ සිට 8 වෙනිදා දක්වා කොළඹ බණ්ඩාර නායක ජාත්‍යන්තර ශාලාවේ පැවැත් වෙන දැයට කිරුළනම් අධ්‍යාපන සංවර්ධන ප්‍රදර්ශන යේ දී ඉහතකී සියල්ල ජනතාවට දැකබලා ගන්නට හැකිවෙනවා ඇත.

# බර්ලිනයේ ශ්‍රීලංකා තානාපති කාර්යාලයට කොටි ප්‍රහාරයක්

**ජ**ර්මණියේ බර්ලින් නගරයේ ශ්‍රීලංකා තානාපති කායර්‍යාලය ඉදිරිපිට ගිය 3 වෙනිදා උද්ඝෝෂණ යක් කළ කොටි හිතවාදී ද්‍රවිඩයින් ආපසු යද්දී ගල්මුල් වලින් පහරදී කායර්‍ාලයේ වීදුරු කඩාදමා අලාභ හානි කර ඇති බව දැනගන්නට ඇත. එසේම මදුරාසියේ චෙන්නායි හි ශ්‍රීලංකා එයාර්ලයින් කාර්යාලයටද එහි ද්‍රවිඩයින් පහරදී අලාභහානි සිදුකර ඇති බව වාර්තා වෙයි.

## ♥ පැටියො ඩාලිං



ඔන්න පැටියො අල්ල ගන්න බැහැයි කියපු කිලිනොච්චියත් අපි අල්ලලා දුන්නා.. දැන් ඉතින් අපේ වැඩ ඉවරයි...

හැබැට...? ෂහ් සැහෙන්න මහන්සි ඇති නේ එහෙනං... රැවුල කපලා ඔහොමම නාගත්ත නම් හොඳයි....

Sam's CHICKEN CHICKEN CHICKEN

Great Tasting! Great Value!

සැම්ස් චිකන්

17 HIGH STREET, WEALDSTONE, HARROW HA3 5BY, TEL: 020 8861 1872
439 HIGH ROAD, WILESDEN, LONDON NW10 2JJ, TEL: 020 8451 7662
84 HIGH STREET, HARLESDEN, LONDON NW10 42J, TEL: 020 8838 2036
246 KINGSBURY ROAD, KINGSBURY, LONDON NW9 9HN, TEL: 020 8204 1432

# Sinhala Lesson 130 සිංහල පාඩම

## සිංහල ඉගෙනීමට පහසු මගක් !

### Causal Verb - ප්‍රයෝජ්‍ය ක්‍රියා

**Observe how the Causal Present and Past Participle are made.**

### Causal Present Participle

ලියවන / ලියවන්නාවූ / ලියවමින් - causing **to write**
මකප්පවන /කප්පවන්නාවූ /කප්පවමින් - causing **to cut**
කවන /කවන්නාවූ /කවමින් - causing **to feed**
කරවන /කරවන්නාවූ /කරවමින් - causing **to do**
යවන /යවන්නාවූ /යවමින් - causing **to send**
උයවන /උයවන්නාවූ /උයවමින් - causing **to cook**

ගුරුවරයා ළමයින්ට උගන්වමින් එතන සිටියි
*The teacher is there teaching the children*
ධාතුසේන රජ කරවූ කලා වැව අපි දුටුවෙමු
*We saw Kalawewa built by King Dhatusena*
මව ළදරුවාට කිරි පොවමින් සිනාසෙයි
*Mother is smiling while feeding milk to the child.*

**Try to recognise Causative Verbs and Participles in your reading and conversation and also use them in sentences. Turn the following verbs into Causative:**
හිනාවෙනවා කඩනවා එලවනවා ඇවිදිනවා දන්නවා අඬනවා වැඩකරනවා හෝදනවා විකුණනවා මහනවා පදිනවා

♦ ආචාර්‍යා සුභද්‍රා සිරිවර්ධන
Dr Subhadra Siriwardane - MA PhD London

# හරස්පද ප්‍රහේලිකා 106

| | | | | |
|---|---|---|---|---|
| 1 | | 2 | 3 | ■ |
| | ■ | 4 | | 5 |
| 6 | 7 | | ■ | |
| 8 | | ■ | 9 | |
| ■ | 10 | | | |

**හරහට :**
1 දුකට හේතුවකි
4 පිරිසිදු 6 කැලල
8 මූර්ඡා වූ
9 උදෑසන දැකිය හැකිය
10 කුණාටුව

**පහළට :**
1 අතීතයේ බඩු ප්‍රවාහනය කළ විදියකි
2 විනාශය
3 නුහුරු අත
5 මහා විලාපය 7 අප රටේ සුලබ කාන්තා නමකි
9 ආයුර්වේදයේ හැඳින්වෙන තුන්දොස් වලින් එකකි.

***ගියවර නිවැරදි විසඳුම්***

**හරහට :** 1 මාලය 3 වත 4 මතු 6 දර 7 වාපි 8 කය 9 නම
**පහළට :** 1 මාගම 2 කතරගම 3 වද 5 තුවාය

## නේක රසෙන් පිරිපුන් සිංහල ඉවුම් පිහුම්

# මාළු සලාදයක්

## Fish Salad

***අවශ්‍ය ද්‍රව්‍ය :*** ගල් මාළු හෝ වෙනත් සුදු පැහැති මාළු ග්‍රෑම් 250 ක්
හොඳින් තම්බා ගත් බිත්තර 2 ක්
සලාද කොළ 2 ක්
පිපිඤ්ඤා ග්‍රෑම් 100 ක්
විනාකිරි තේ හැඳි 3 ක්
සීනි තේ හැඳි 1 ක්
අබ තේ හැඳි 1 ක්
එළවළු තෙල් ස්වල්පයක්
හා පාස්ලි ටිකක්
ලුණු හා ගම්මිරිස් අවශ්‍ය පමණට

***සාදන ක්‍රමය :*** මාළුවල කටු හා හම ඉවත් කර කුඩා කැබලි වලට කපා ගන්න. ඉන්පසු එය බඳුනකට දමා ලුණු ටිකක් හා ගම්මිරිස් ඇට ටිකක් එකතු කර තම්බාගන්න.

සලාද කොළ සහ පිපිඤ්ඤා අඟල් ¼ ක ප්‍රමාණයට කොටු කපා ගන්න. තම්බාගත් බිත්තර දෙකත් ඒ අයුරින්ම කපා ගන්න. පාස්ලි ටික සිහින්ව ලියන්න.

බඳුනක් ගෙන එයට විනාකිරි, සීනි, අඹරාගත් අබ සහ තෙල් තේ හැඳි දෙක දමා හොඳින් මිශ්‍රකර ගන්න. එයට ලුණු සහ ගම්මිරිස් ද අවශ්‍ය ප්‍රමාණයට එක්කර ගන්න. මෙම මිශ්‍රණයට ඉහත සඳහන් මාළු, කපාගත් බිත්තර, පාස්ලි, පිපිඤ්ඤා සහ සලාද කොළ එකතු කර හොඳින් මිශ්‍රකර ගන්න.

♦ ***පුෂ්පා රණවීර*** Sri Lanka

*මෙහි පළකිරීම සඳහා ඔබගේ කෑම වට්ටෝරු ලියා එවන්න*